www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# අධිරාජ්‍යවාදී කුහකත්වය හා නැගෙනහිර යුක්‍රේනයේ විරෝධතා පිලිබඳ මුසාවාද

## Imperialist hypocrisy and lies on eastern Ukraine protests

**2014 අප්‍රේල් 10**

නැගෙනහිර යුක්‍රේනයේ රුසියාවට හිතවත් විරෝධතාකරුවන් ප්‍රාදේශීය ආන්ඩුවේ ගොඩනැගිලි අල්ලාගැනීමත් සමග පැතිර යන ගැටුම මධ්‍යයේ එක්සත් ජනපද නිලධාරීහු හා ඇමරිකානු මාධ්‍ය, එම ක්‍රියා උසිගන්වන බවට කුහක ලෙස රුසියාව හෙලා දකියි. මෙම චෝදනා කරුනු කාරනා ලෙස මිස තහවුරු කරන ලද දේ ලෙස ඉදිරිපත් නොකරන අතර තාඩන පීඩනයට ලක් කර හුදෙකලා කොට අවසානයේදී රුසියාව ම කැබලි කිරීම අරමුනු කරගත් නැගෙනහිර යුරෝපයේ අධිරාජ්‍යවාදී මැදිහත්වීම දැඩි කිරීමේ කොටසකි. වොෂින්ටනයේ මූලිකත්වයෙන් ගෙන යන මෙම වගකීම් විරහිත හා ආක්‍රමනකාරී පිලිවෙත, න්‍යෂ්ටික බලවතෙකු වන රුසියාව හා බටහිර අතර යුද්ධයයි.

යුක්‍රේන අභ්‍යන්තර ඇමති ආසෙන් ඇවකොව් 09දා, පැය 48ක් ගතවීමට මත්තෙන් විරෝධතා තලා දමන බවට තර්ජනය කල අතර යුක්‍රේනයේ "සිවිල් යුද්ධය" පිලිබඳව අනතුරු ඇඟවීමට රුසියානු විදේශ ඇමති පෙලඹවීය.

විරෝධතා, යුක්‍රේනය අත්පත්කර ගැනීමට රුසියාව යෙදී සිටින කුමන්ත්‍රනයක් ලෙස හැඳින්වූ වොෂින්ටනය, මර්දනය සඳහා කොල එලිය දල්වමින් ප්‍රතිචාර දැක්වීය. රුසියාවට එරෙහිව ආර්ථික සම්බාධක පැනවිය යුතු බව කියා සිටිමින් *වොෂින්ටන් පෝස්ට්* පුවත්පත පලකල කතුවැකියකින්, විරෝධතාකරුවන් "කුලියට ගත් මැරයින්" ලෙස හෙලා දුටුවේය. "සාමය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා යුක්‍රේන ආන්ඩුවට පූර්න සහාය ලබාදෙමින් කෙටි කාලයේදී රුසියානු මූලෝපාය පරාජය කරන ලෙස" පුවත්පත වොෂින්ටනයට හා යුරෝපීය සංගමයට උපදෙස් දුන්නේය.

ඊට පෙර දිනයේ රාජ්‍ය ලේකම් ජෝන් කෙරී, "අපි හුදෙක් දකිමින් සිටින්නේ, ජාත්‍යන්තර දේශසීමා හරහා, කුලී මෙහෙයුම් සමග උපක්‍රමිකව මෙහෙයවූ අර්බුදයක් නිර්මානය කරමින්, ස්වෛරී රාජ්‍යයක් අස්ථාවර කිරීමේ අනීතික හා නීති විරෝධී රුසියානු උත්සාහයන්" බව පවසමින් සෙනේට් සභාවේ විදේශ සම්බන්ධතා කමිටුව හමුවේ සාක්ෂි දෙන ආකාරය දක්නට ලැබුනි. කෙතරම් කුහකත්වයක් ද! කියෙව්හි පෙබරවාරි කුමන්ත්‍රනයට පිටුබලය දෙමින් වොෂින්ටනය හා එහි අනුචරයින් කරන ලද දෙයම කරන රුසියාවට දැන් තමා දොස් පවරන බව කෙරී හොඳින්ම දැන සිටියි. එහිදී ඔවුන් කලේ, රුසියාවට පක්ෂපාතී යුක්‍රේන ජනාධිපති වික්ටර් යනුකොවිච් තන්ත්‍රය අස්ථාවර කර පෙරලා දැමීමයි. යනුකොවිච් පෙරලා දැමීම සඳහා එක්සත් ජනපදය යොදාගත් ප්‍රධාන තර්කය වූයේ ඔහු විපක්ෂය මතට කඩා පැන එය මර්දනය කිරීම ය. දැන් වොෂින්ටනය දක්ෂිනාංශික රූකඩ තන්ත්‍රයට කිරීමට අනුබල දෙන දෙයම ය.

එක්සත් ජනපද "කුලී කන්ඩායම්" කුලියට ගනු ලැබුවේ "ප්‍රජාතන්ත්‍රවාදය" වෙනුවෙනි. ඔවුහු දක්ෂින නිකායේ හා ස්වබෝධා පක්ෂයේ ක්‍රියාකාරිකයින් හා ෆැසිස්ට් මැරයින් වූහ. ඔවුන්ගේ යුදෙව් විරෝධී හා විදේශිකයින් නොරුස්නා දේශපාලනය 2012 දෙසැම්බරයේදී යුරෝපීය පාර්ලිමේන්තු ඡන්දයකදී හෙලාදකින ලදී. රාජ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරිනියක් වන වික්ටෝරියා නුලන්ඩ්, 1991 සෝවියට් සංගමය විසුරුවා හැරීමෙන් පසුව වොෂින්ටනය, යුක්‍රේනය තුල එවන් විපක්ෂ කන්ඩායම් ගොඩනැගීම පිනිස ඩොලර් බිලියන 5ක් වැයකර ඇති බවට කයිවාරු ගැසුවාය.

කෙරී හා එක්සත් ජනපද මාධ්‍යයේ නිල නොවන රාජ්‍ය ප්‍රචාරක මෙවලම්, යුක්‍රේන පරමාධිපත්‍යයේ හා නීත්‍යානුකූල භාවයේ ධර්මිෂ්ඨ ආරක්ෂකයින් ලෙස සිය ආස්ථානය සමග, මෑතවින් ලේඛනගතව තිබෙන, ෆැසිස්ට් බලවේග සමග බැඳී ඇති රූකඩ තන්ත්‍රයක් නීති විරෝධී ලෙස ඇටවීමේදී එක්සත් ජනපද ආන්ඩුව විසින් යුක්‍රේන පරමාධිපත්‍යයට වල කැපීමට ගෙන ගිය වැඩකටයුතු සසඳා බැලීමට කිසිදු උත්සාහයක් දරන්නේ නැත. මහජන මනෝගතියට සතුරු එවැන්නෝ, යුක්‍රේනය මුල්කරගත් යුද්ධයකට විරුද්ධ වන මහජන මතය ඒත්තු ගැන්වීමේ කිසිදු අවශ්‍යතාවක් නොදකින අතර ඒ වෙනුවට, බියගැන්වීම, නිෂ්ක්‍රීය කිරීම හා ව්‍යාකූල කිරීමට උත්සාහ කරති.

කියෙව්හි මාර්ග බාධක ඉදිකරමින් ක්‍රියාත්මක වූ අන්ත දක්ෂිනාංශික පැරාමිලිටරි බලයන්ට සහයෝගය පලකිරීම පිනිස කුමන්ත්‍රනය දියත් කිරීමට ආසන්නව තිබිය දී එක්සත් ජනපදයේ දේශපාලඥයින් හා රාජ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීහු කියෙව් නිදහස් චතුරශ්‍රයට පැමින සිටියහ. ඔවුන් අතර නියුලැන්ඩ් හා යුක්‍රේනයේ එක්සත් ජනපද තානාපති ද වූහ. යනුකොවිච් පාලනය පෙරලා දැමීමේ උද්ඝෝෂනයේ හිනි පෙත්තේදී යුරෝපීය, ඇමරිකානු හා නේටෝ නිලධාරීන් ද රුසියානු විරෝධී විපක්ෂයේ නිලධාරීන් ද අතර නිල රැස්වීම් පැවැත්වුනි. වත්මන් අගමැති ආසනි යැට්සෙන්යුක් ("යැට්ස්")ය නු කො වි ච් වෙනුවට රූකඩ ආන්ඩුවේ නායකයා ලෙස පත්කිරීමට ඔවුන්ට අවශ්‍ය විය. මෙහිදී නියුලැන්ඩ් හා යුක්‍රේනයේ

එක්සත් ජනපද තානාපති අතර පැවති මාධ්‍ය වෙත කාන්දුවූ දුරකථන සාකච්ඡාව ද කැපී පෙනෙයි.

කුමන්ත්‍රනය වෙනුවෙන් ඒ සා විශාල මුදල් කන්දරාවක් වැය කල වොෂින්ටනය, එය පිලි නොගැනීම ගැන බෙහෙවින් කෝපයට පත්ව සිටියි. යනුකොවිච්ගේ බල කඳවුර ද වූ රුසියාව සමග සමීප භාෂාමය හා කාර්මික සම්බන්ධතා සහිත නැගෙනහිර යුක්‍රේනියානු ප්‍රදේශ, කියෙව් තන්ත්‍රයේ උග්‍ර වෛරයට පාත්‍රවී ඇති අතර ඔවුන් රුසියානු භාෂාවේ නිල තත්වය අහෝසි කිරීමට දිව්රුම් දී සිටියි. ඒ අතර යුරෝපීය සංගමය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිර්දේශ කර තිබෙන කප්පාදු පියවර ක්‍රියාත්මක කරමින් සිටියි. මෙම දුක් ගැනවිලි, ඩොනෙට්ස්ක්, ලූහාන්ස්ක් හා කාකිව්හි දහස් ගනන් ජනතාවගේ රුසියාවට පක්ෂපාතී විරෝධතා සඳහා හේතුකාරක වී තිබේ. එය කලාපය තුලින් ලබාගත් එක්සත් ජනපද මාධ්‍ය වාර්තා කිහිපයකින් පිලිගෙන තිබේ.

"යුරෝපයට පක්ෂපාතී විරෝධතා ව්‍යාපාරයේදී මෙන් නොව ඩොනෙට්ස්ක්හි කැලඹීම් වලට තවමත් මධ්‍යම පන්තියේ සහයෝගය පලව ඇත්තේ මඳ වශයෙනි. ඒවායේ ප්‍රමුඛතාව ගෙන ඇත්තේ, සෝවියට් සංගමය කෙරෙහි සැක සාංකා හා කෝපය පල කරන විශ්‍රාමිකයින් හා නිතර බීමත්ව සිටින තරුනයින්ය. බරපතල ලේ සෙලවීමකට තුඩුදෙන මර්දනයක් විරෝධතාකරුවන්ගේ ඉල්ලීම් වඩා පුලුල් කල හැකිය. එම ප්‍රදේශ බොහෝකොටම රුසියානු බස කථාකරන කියෙව් නායකයින් කෙරෙහි සුලු ඇල්මක් පමනක් ඇති ජනයාගෙන් සමන්විතය., මෙය *නිව් යෝර්ක් ටයිම්ස්* වාර්තාකරුවෙක් ඩොනෙට්ස්ක්හි සිට එවන ලද ලද්දකි.

යුක්‍රේන අර්බුදය සම්බන්ධයෙන් ගත් කල ආක්‍රමනිකයා වන්නේ වොෂින්ටනය හා එහි අනුචර යුරෝපා සංගම් බලවතුන්ය. රුසියාවට එරෙහිව සම්බාධක පැනවීමේ තර්ජන හා අභ්‍යන්තර මර්දනය, යුක්‍රේනය තුල රුසියානුවන්ට එරෙහි ලේවැකි වාර්ගික යුද්ධයක් බවට පත්විය හැකි අතර රුසියාව ද ඊට ඇදී ආ හැකිය. කලාපය තුල තම ආර්ථික හා භූ-මූලෝපායික අවශ්‍යතා වෙනුවෙන් ගෝලීය යුද්ධයක අවදානම තිබියදී පවා, ඔවුන් කිසිවකින් හෝ නතර නොවන බවට ඇඟවුම් කර තිබේ.

මෙය පිලිගැනීමෙන්, ජනාධිපති ව්ලැඩිමීර් පුටින්ගේ රුසියානු තන්තත්‍රයට හෝ යුක්‍රේනයේ වාර්ගික බෙදීම් පිලිබඳ ඉදිරිදර්ශනයට හෝ කිසිදු දේශපාලන සහයෝගයක් දෙන බවක් ඇඟවුම් නොකරයි. සෝවියට් සංගමය විසුරුවා හැර ධනවාදය පුනස්ථාපනය කල අවධියේ රාජ්‍ය දේපොල සොරාකෑම මගින් යුක්‍රේනය තුල මතුවී ආ මැර කතිපයාධිකාරය වැනි ම තන්ත්‍රයක් මත පුටින්ගේ රුසියානු පාලනය ද රැඳී ඇත.

යුද්ධයට පතුලෙන්ම විරුද්ධ, යුක්‍රේනයේ ගැටුම් පතුරුවා හැරීමේ නියුතු අධිරාජ්‍යවාදී බලවතුන් නතර කල හැකි, එකම බලවේගය වන පැරනි සෝවියට් සංගමයේ ද යුරෝපයේ හා එක්සත් ජනපද කම්කරු පන්තිය ට ආයාචනා කිරීමට කම්කරු පන්තියට සතුරු එම තන්ත්‍රයට හැකියාවක් ඇත්තේ නැත.

බටහිර ප්‍රකෝපකරනයෙන් යුක්‍රේනය තුල සිය අවශ්‍යතා රැකගැනීමේ එහි පියවර මගින්, රුසියානු ජාතිකවාදය ඇවිස්සීමත්, එරටට සපයන රුසියානු ගෑස් මිල නැංවීමත් මගින් යුක්‍රේන කම්කරු පන්තිය තවත් දුප්පත් කර වාර්ගික රේඛා ඔස්සේ බෙදා දැමීමට පමනක් සමත්වනු ඇත.

ඇමරිකානු පාලක පන්තියට, තම බොරු වැපිරීමටත් සාපරාධී විදෙස් පිලිවෙත හුවා දැක්වීමටත් දූෂිත හා හීලෑ මාධ්‍ය ගැන ඔට්ටු ඇල්ලීමට හැකිය. සීමෝ හර්ෂ්ගේ අලුත්ම හෙලිදරව් කිරීම් ප්‍රධාන මාධ්‍ය මගින් වාරනය කර තිබියදී පවා, සිරියාවේ රසායනික අවි ප්‍රහාර ගොතන ලද ඒවා සේ පෙන්නුම් කලා සේම, 40,000ක රුසියානු හමුදාවන් රුසියානු -යුක්‍රේන දේශසීමාව කරා මෙහෙයවන බවට සැටලයිට් (චන්ද්‍රිකා) ඡායාරූප ගෙනහැර දැක්වීම ද සැලකිය යුතු වන්නේය.

රුසියාවට විරුද්ධ චෝදනා සාක්ෂිමය තොරතුරු මගින් සනාථ නොකෙරේ. ක්‍රෙම්ලිනය ඒවා හෙලාදැක ඇත. නේටෝව තමන් සතු යයි කියාගන්නා චන්ද්‍රිකා ඡායාරූප, වානිජ්‍ය ඒවා පවා, මුදාහැරීම ප්‍රතික්ෂේප කරයි. රුසියානු යුක්‍රේන දේශසීමා ඔස්සේ සංචාරය කල සීඑන්එන් වාර්තාකරු ෆිල් බ්ලැක්, "තම කන්ඩායමට රුසියානු හමුදා මෙහෙයුමක් පිලිබඳ කිසිදු හෝඩුවාවක් දැකගත නොහැකිවූ" බව වීඩියෝ වාර්තාවකින් ගෙනහැර දැක්වීය.

එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන් පසුගිය දශකය තිස්සේ දියත්කල අනෙකුත් සියලු අපකීර්තිමත් යුද්ධයන් සඳහා කඩතුරාව ලෙස ඉදිරිපත් කල සියලු බොරු සේම යුක්‍රේනයේ රුසියානු ආක්‍රමනයක් අනිවාර්ය බවට පල කෙරෙන වාර්තා ද බොරු තොගයක් යයි සැලකීමට ඇමරිකානු ජනතාවට පූර්න අයිතියක් ඇත.

නිමක් නැති බොරු හා ප්‍රකෝපකරනයන් වැල පෙන්නුම් කරන්නේ දේශපාලන ශක්තියක් නොව අධිරාජ්‍යවාදයේ ප්‍රගාඪ අර්බුදයයි. එක්සත් ජනපදය හා යුරෝපයේ කම්කරුවන්ට සිදුවන්නේ කුමක්දැයි පෙනීයන තාක් දුරට ඔවුන් තව තවත් කෝපයට පත්වනු ඇත. මෙම විරුද්ධත්වය, අධිරාජ්‍යවාදයට, එහි දේශපාලන නියෝජිතයින්ට හා සමස්ත ධනේශ්වර පද්ධතියටම එරෙහිව කම්කරු පන්තියේ ජාත්‍යන්තර ව්‍යාපාරයක රූපාකාරය සහිත දැනුවත් ප්‍රකාශනයක් ලබාදෙමින් බලමුලු ගැන්විය යුතුය.

**ඇලෙක්ස් ලැන්ටියර්**

© www.wsws.org